අයටත් දැන් තියෙන්නේ මහ හදිස් සියක්. මොකක්ද ඔය තරම් නියත හදිස්සිය මැතිවරණ පවත්වන්න. අපිට මැතිවරණ ගැන කිසිම හදිස්සියක් නෑ. කලබලයක් නෑ. අනික ඕවට කෝටි ගණන් වියදම් කරන්නේ අපේ සල්ලි. ඕනේ නම් මේ අවුරුද්දම හිටියත් අපිට කමක් නෑ. අරගෙන මේ වැඩේ කරලා ජනතාව අතරට එන්න. ඒකයි කළ යුතුවන්නේ. නැත්නම් ජනතාව මේ ගොල්ලන්වත් ප්‍රතික්ෂේප කරනවා. ජනතාවට පෙන්වන්න මේවා අදලා කවුද හොරකම් කළේ? කවුද කප්පම් ගත්තේ? ඇයි මේ හොරුන් ජනතාවට හඳුන්වලා දෙන්නේ නැත්තේ? ඇයි මේ ටික හංගගෙන ඉන්නේ? ඇයි මේ ෆයිල් හංගගෙන ඉන්නේ. අපිට සැකේකුත් ඇතිවෙනවා මොකක් හරි හේතුවක්, යටිකූටිටු ව්‍යාපාරයක් මේකේ තියනවාද කියලා.

ජාතික විධායක සභාව වැනි අලුත් ආණ්ඩුවේ තීරණ ගන්නා මණ්ඩලවලට ඔබවහන්සේ ප්‍රමුඛව මේ දේශපාලන වෙනස කිරීමට මුල් වූ කණ්ඩායමේ සාමාජිකයන් ඇතුළත් වෙයි කියලා ජනතාව හිතුවා. එලෙස සහභාගි කරගන්නවා කියලා තමයි මැතිවරණ වේදිකාවලදී අහන්න ලැබුණෙත්. නමුත් අඩුතරමින් ඔබවහන්සේටවත් ජාතික විධායක සභාවට ආරාධනා ලබිලා නෑ නේද?

වෙනත් ආණ්ඩුවල විධායක සභාවක් හිටියේ නෑ. නමුත් මෙවර ජනාධිපතිවරණයෙන් පස්සේ රජයට යම් යම් කරුණු පෙන්වා දීම සඳහා ජාතික විධායක සභාවක් පත්කරගවා කියලා යෝජනාවක් තිබුණා. ඒ අනුව විධායක සභාවක් පත්කරලත් තියනවා. ඒකට මාවත් පත්කළාය කියලා පත්තරවල පලවෙලා තියනවා මම දැක්කා. සාමාන්‍යයෙන් රජයක පත්වීම් කරනකොට නිල වශයෙන් ලිපියක් එවනවා නේ. මට එහෙම ලිපියක් එවලත් නෑ. මට කතා කරලා කවුරුවත් කිව්වෙත් නෑ. අද වෙනකම් එකම දවසක්වත් මට ඕකට ආරාධනාවක්වත් ලැබිලා නෑ. හැබැයි මිනිස්සු හිතාගෙන ඉන්නවා මාත් ඕකේ ඉන්නවා කියලා. ඒ නිසා මගෙන් මිනිස්සු අහනවා ඔබවහන්සේ ඇයි

> ප්‍රතිපත්තිය ජයග්‍රහණය කරගන්නට අපි සියලුදෙනාම එකා වගේ නැඟිටින්න ඕනේ. මම ශ්‍රී ලංකාකාරයෙකුත් නෙවෙයි. යූඑන්පී කා රයෙකුත් නෙවෙයි. මට ඕනේ රටම දිනවන්නයි. ඒකට මේ ප්‍රතිපත්ති ජයග්‍රහණය කරවිය යුතුයි.

මේ දේවල් විධායක සභාවෙදි නොකියන්නේ කියලා. කියන්න මම එතනට යන්න එපායැ.

අලුත් ආණ්ඩුවක් බලයට පත්කරගන්න මුල් වුණු ඔබවහන්සේ ඇතැලූ සිවිල් සංවිධාන ආණ්ඩුවේ කටයුතුවලින් ඉවත් කර ආණ්ඩුව කටයුතු කරගෙන යන බවක් නේද පෙනෙන්නේ?

ඉවත් කරලා නෙවෙයි. හැමදාමත් ලංකාවේ සිද්ධ වෙන ක්‍රමේ ඕකනේ. අපි ආණ්ඩුවක් බලයට පත්කරනවා. ඊට පස්සේ ඒ අයට ඒක බාරදීලා අපි නිදාගන්නවා. ඒ අය කැමති විදිහට ආණ්ඩුව කරගෙන යනවා. අල්ලස් දූෂණ වංචා ඔක්කෝම අපිට ඇවිත්වා. ඒත් අපි සෑහගහන්නේ නෑ.

ඉන්දියාවේ සිවිල් ජනතාව කොච්චර කෑ ගැහුවාද මේ වගේ දේවල්වලට විරුද්ධව. මේ සැරෙත් වේගන යන්නේ ඒක තමයි. ආණ්ඩුව බලයට පත් කළාට පස්සේ අපිට ඕනේ වෙන්නේ ඒ කතා කළ දේවල් නෙවෙයි. අපේ ළමයා ඉස්කෝලෙට දාගන්න. අපිට රස්සාවක් ගන්න. උසස්වීමක් ගන්න. තරඟකාරයෙක්ගෙන් පලිගන්න. ඒ පරණ දාං අදදිල්ල තමයි මේ සැරෙත් කරන්නේ. නමුත් අපි ආවේ ඕකට නෙවෙයි. නමුත් පුරුදු වෙලා තියන විදිහෙන් අපේ චින්තනය මාරු කරගන්න හරි අමාරුයි. ප්‍රතිපත්තිය ජයග්‍රහණය කරගන්නට අපි සියලුදෙනාම එකා වගේ නැඟිටින්න ඕනේ. මම ශ්‍රී ලංකාකාරයෙකුත් නෙවෙයි. යූඑන්පීකාරයෙකුත් නෙවෙයි. මට ඕනේ රටම දිනවන්නයි. ඒකට මේ ප්‍රතිපත්ති ජයග්‍රහණය කරවිය යුතුයි.

අලුත් ආණ්ඩුව ජනතාව බලාපොරොත්තු වූ මාර්ගයෙන් වෙනස් මාර්ගයක යන බව පෙනෙන්නට පටන්ගත්තට පස්සේ ඔබවහන්සේ මොකද හිතුවේ?

ප්‍රශ්නය තියෙන්නේ වෙනස් මාර්ගයක යනවට වැඩිය වේගවත්කමක් නැති එකයි. ගමන ආරම්භ කරලා යනවා. නමුත් බොහොම ස්ලෝ යන්නේ. මොකක්දෝ බැරිරි බැහැපු ගතියක් තියනවා. වේගවත් නැතිකමයි පෙනෙන්නේ. ඉතිං අපි තල්ලු කරන්න ඕනේ.

ඇතිවෙලා තියන මේ තත්ත්වයන් සම්බන්ධයෙන් වත්මන් අගමැතිවරයා හෝ ජනාධිපතිවරයා සමග අදහස් හුවමාරු කරගන්න ඔබවහන්සේට අවස්ථාවක් ලැබුණාද?

මේ ගැන සාකච්ඡා කීපයක් සිද්ධ වුණා. එතකොට ඒ අය මේවට විවිධ හේතු ඉදිරිපත් කරනවා. එකසැරේ නඩු දාන්න බෑ. ඒවා පරීක්ෂණ කරන්න ඕනේ. ඒවා මේවා කරනකොට මේවාට කල්ගතවෙනවා කියලා තමයි ඒ ගොල්ල කියන්නේ

ජනතාව අපේක්ෂා කළ වෙනස මේ ආණ්ඩුවෙන් කරගන්න බැරි තත්ත්වයක් උදා වෙනවා නම් ඒ වෙනස කරගන්නට ඔබවහන්සේ කොහොමද ජනතාව සමග එක් වෙන්න බලාපොරොත්තු වෙන්නේ?

මම හැමදාම ජනතාවගේ පැත්තේ ඉන්න කෙනෙක්. ඒ නිසා ඉදිරියටත් මම එහෙමයි. කිසිම වෙලාවක පක්ෂයක් පැත්තේ ඉන්නේ නෑ. මැතිවරණය සම්බන්ධයෙන් වුණත් අපි කියන්නේ අපිට මැතිවරණයක් එපා. අපිට ඕනේ මේ පොරොන්දු ටික ඉෂ්ට කරගෙන මැතිවරණයකට යන්නයි.

ලංකාවේ දේශපාලනයේ හැමදාම තියෙන්නේ ප්‍රභූ පන්තියක් අතරේ තට්ටු මාරු ක්‍රමයට බලය හුවමාරු රැවීමක්. ඉන්දියාවේ අරවින්ද් කේජ්රිවාල් යම් අලුත් ආදර්ශයක් ලබාදී තිබෙනවා දේශපාලන ප්‍රභූ පන්තියෙන් පිටස්තර සිවිල් ජනතාව දේශපාලනයට කැඳවමින්. ඔවුන් අතට දේශපාලන බලය ලබාගනිමින්. ලංකාවේදී එවැනි ආදර්ශයක් සඳහා නායකත්වය සපයන්න ඔබවහන්සේ සූදානම්ද?

අනාගතයේදී අපිට ඉන්දියානු ආදර්ශය ගන්න වෙනවා. ව්‍යවස්ථා සංශෝධනවලින් පමණක් රටට යහපත් ප්‍රතිපලයක් ගේන්නේ නෑ. ජනතාව පෙළ ගැසිය යුතුයි. ජාතීන් අතර එක්සත්ව ජීවත්වීමේ වැඩසිළිවෙළක් හඳාගන්න ඕනේ කරලා තියනවා. මේකෙදි අපිට ඉන්දියානු ආදර්ශය වගේම දකුණු අප්‍රිකාවේ ආදර්ශයත් ගන්න පුලුවන්. ලංකාවේ ආර්ථික විප්ලවයකුත් සිදුවීම අවශ්‍යයයි. අපි එහෙම පිටින්ම විශ්වාසය තියලා තියෙන්නේ සංචාරක ව්‍යාපාරය ගැන. ඒ වගේ සංචාරක ව්‍යාපාරයක් ගැන හිතන එක හොඳයි සිංගප්පූරුව, මාලදිවයින වගේ සම්පත් කිසිවක් නැති රටකට. අපේ රටේ එවැනි සම්පත් හිඟයක් ඇත්තෙත් නෑ. මේ රටේ වැව් ටික හදාගන්න ප්‍රමුඛත්වය දුන්නොත් අපිට හොඳ කෘෂිකාර්මික රටක් හදාගන්න පුලුවන්.

අපි දැන් හිතන්න ඕනේ හුගාක් දේවල් තියනවා. අපේ රටේ කාන්තාවෝ ලක්ෂ ගානක් මැද පෙරදිග වහල් මෙහෙයේ ඉන්නේ. නොයෙකුත් අතවරවලට පත්වෙලා පඩිත් නැතිව එන කාන්තාවෝ හැමදාම අපිට ජේනවා. අපි මේ වහල් සේවය නවත්තන්න නැත්ද? මේ රටේ කිසිම කර්මාන්ත දියුණුවක් නෑ. අපි රට ඇතුලේ අල්මපනෙත්තක්, ඉදිකටුවක් හදන වැඩ පිළිවෙළක් හදලුවද? මොකක්ද අපිට හදාගන්න පුලුවන් වුණේ? රුසියාවෙන්, තායිවානයෙන් ගණිකාවන් ගෙනැල්ලා ගණිකාවෝ ප්‍රදර්ශනය කර කර කසිනෝ ශාලා දාලා ඒවායින්ද රට දියුණු කරන්න හදන්නේ. අර බලන්න මහානාම විද්‍යාලය ඉදිරිපිට මහා විශාල කසිනෝහලක්. එතන ගැඹු හෙළුවෙන් නටනවා. මොනා පැත්තේ ඉස්කෝලේ. එහා පැත්තේ පන්සල. රටේ සාදාචාරය ඉරවයි. දුරාචාරයෙන් රට පිරිලා. මේ ක්‍රමය අනෙක් පැත්ත හැරෙව්වේ නැත්නම් මුළු තරුණ පරම්පරාවම විනාශ වෙනවා. මේ සංචාරක රටක් කරන්න දැගලිල්ලෙන් කවදාවත් ගොඩයන්න ලැබෙන්නේ නෑ. අපි විනාශ වෙන එකයි වෙන්නේ.

පසුගියදා උතුරු පළාත් සභාව යෝජනාවක් සම්මත කරගත්තා උතුරේ ජන සංහාරයක් සිදුවෙලා තියනවා කියා ඒ ගැන ජිනීවා මානව හිමිකම් කොමිසමට කරුණු කියන්න. ඇතැම් ජනමාධ්‍ය මෙය වාර්තා කරලා තිබුණේ අලුත් ආණ්ඩුව බලයට පත්කරගත් නිසා කොටියා නැවත නැඟිටීමක් ලෙසයි. මේ කාරණය ඔබවහන්සේ දකි න්නේ කොයි විදිහටද?

යුද්දේ ඉවර වෙච්ච ගමන්ම ලංකාවට ඇවිල්ලා ඒ ගැන පරීක්ෂණයක් පවත්වන්න කියලා බැන්කී මූන්ට ආරාධනා කළේ මහින්ද රාජපක්ෂ මහත්තයානේ. එහෙම පරීක්ෂණයක් ආරම්භ කිරීම ගැන ස්තුති කරලා පී.එල්. පිරිස් මහත්තයා ලිපියකුත් ඇරියා. ඒ නිසා කවුරු කළත් පරීක්ෂණයක් කරන්නේ හරි වැරදි හොයාගන්න නේ. ඒක වටිනවා. මට අසතීපයක් තියනවා නම් ඒ ගැන හොඳ පරීක්ෂණයක් කරලා ඒකට බෙහෙත් කරන්න ඕනේ. අපි හිටැරදි නම් අපි මොකටද ඒකට බය වෙන්නේ.

ඒක කොටියා නැවත නැඟිටීමක් කියන කතාව?

මේ විදිහට අසාදාරණය, අවනීතිය ඉදිරියට ගියොත් නම් කොටියා විතරක් නෙවෙයි සිංහයත් නැඟිටිනවා. අසාදාරණය, අවනීතිය පිරිච්ච, ජනතාව සූරාකන, සංවර්ධනයක් නැති රටක් වුණොත් උතුරේ නෙවෙයි මෙහෙ ඉන්න කොටිත් නැඟිටිනවා. එහෙම නැඟිටින්නේ නැති වෙන්න තමයි රට හදාගන්න ඕනේ කරන්නේ. ඒ මිනිස්සුන්ටත් සාදාරණය ඉෂ්ට වෙනකොට ඒ මිනස්සුත් නිහඬ වෙනවා. ප්‍රශ්නේ විසඳන්නේ නැතිව කොටි කිය කියා හැමදාම මන්තරා හරියන්නේ නෑ.

පොදු අපේක්ෂකයා ලෙස විශේෂ අරමුණු වෙනුවෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා ලෙස තේරී පත්වූ පසු ඔහු ඒ අරමුණුවලට කිසිසේත් සහාය නොදක්වපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධුරයට පත්වෙනවා. මේ කාරණය ඔබවහන්සේ කොහොමද දකින්නේ?

එතුමා ජනාධිපතිවරණයේදී දුන් එකම පොරොන්දුවක්වත් ඉෂ්ට කරගන්න බෑ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජාතික පක්ෂයේ සහයෝගයෙන් තොරව. මේ දෙගොල්ල එකට එකතු කරගෙන හිටියොත් පමණයි මේ ටික කරගන්න පුලුවන්වෙන්නේ. මේ ටික කරගත්තට පස්සේ බෙදුනට කමක් නෑ. එතුමා ඒ සඳහා උපතුමශීලිව වෙන්න ඇති මේ කටයුතු කරන්නේ. හිටපු ජනාධිපතිවරයා නැවත දේශපාලනයට කැඳවීම සඳහා පසුගිය දහඅටවෙනිදා නුගේගොඩ පැවැති ජන රැළිය ගැන විවිධ මත පළවෙනවා.

ඔබවහන්සේ ඒ රැස්වීම දකින්නේ මොන විදිහටද?

ඔයිට වැඩිය සෙනග හිටිය රැස්වීම් අපි දැක්කනේ ජනාධිපතිවරණය කාලේ. ලංගම බස් හත් අට සීයක් දාලා සෙනග ඇදද්දා. බත් පැකට් එකටනේ ආවේ. සුපුරුදු සම්ප්‍රදායම තමයි නුගේගොඩ රැස්වීමෙදිත් කළේ. මේ සැරේ ගෙනාව බස් ඇතින් නැවැත්තුවා මිනිස්සු දකියි කියලා. අපේ පන්සල ළඟත් බස් විසිපහක් තිහක් නවත්තලා තිබුණා. පොලිසිය පැත්තෙත් දිගටම තිබුණා. ඒවයින් මහින්ද රාජපක්ෂ මහත්තයා ජයග්‍රහණය කරනවා කියලා කියන්න බෑ. ඒවා තිකං පුහු මවාපෑම්. සංදර්ශන.

ඔබවහන්සේ වත්මන් ආණ්ඩුව ගැන කළ කිරිමෙන්ද පසුවෙන්නේ ?

නෑ, කලකිරීමක් නෙවෙයි දුකක් තියෙන්නේ.

ශ්‍රී ලාංකික ශ්‍රවණ ආබාධිත දරුවන් වෙත සුබ පණිවුඩයක්

මිනිසා සැමවිටම තම ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වයෙන් පිරිපුන් කෙනෙක් ලෙස ජීවත්වීමට කැමතිය. දෘෂ්ටිය, ශ්‍රවණය, ඝ්‍රාණය, රසය විඳීම, ස්පර්ශය ආදියෙන් පූර්ණ කෙනෙක් ඉහත කී කුමණ හෝ ඉන්ද්‍රිය දෝෂයකින් කිසිදාක තමන්ට හානියක් වේදෝ යි නොසිතනු ඇත. ඒ මිනිස් ස්වභාවයයි. මේ ගැන කෙනෙක් අවදිවන්නේ යම් දවසක ඉහතකී ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය ක්‍රම ක්‍රමයෙන් තමන්ගෙන් ඈත් වන්නට පටන්ගත්විටයි. ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය කෙනෙක් සතුව තිබී පසුව එය තමන්ගෙන් මිදී වෙන්වී යෑම එක් කරුණකි. කිසිම දාක, නොඑසේනම් උපතින්ම මෙම ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය නොලැබ තිබීම තවත් කරුණකි. මේ දෙවර්ගයටම අයත් වූවෝ අප අතර වෙති.

අප රටේ සෑම රෝහලකම පාහේ කණ, නාසය, උගුර සම්බන්ධ රෝගී අයට ප්‍රතිකාර කිරීමට කණ, නාසය, උගුර (ENT) රෝගී අංශ පිහිටුවා අතත. මා විස්තර කිරීමට උත්සහ කරන්නේ දකුණු කොළඹ කළුබෝවිල ශික්ෂණ රෝහලේ ENT අංශයට සම්බන්ධ වෛද්‍ය සුනෙත් රාජවාසන් මැතුතුමා සම්බන්ධවූ අපූරු සිද්ධියක් ගැනයි. මේ ගැන අපට දැනගන්නට ලැබුණේ සති අන්ත ඉරුදින පුවත්පතකට එතුමා සම්බන්ධ වූ සිද්ධියක් ගැන කියවීමට අවස්ථාවක් ලැබුණු පසුය. එතුමාම විස්තර කරන පරිදි නොයෙකුත් මාදිලියේ හිඟන වෙස් ගනිමින් නොයෙක් රෝගී තත්වයන් හෝ රෝගී යයි සම්බන්ධ බවට සත්‍ය හෝ අසත්‍ය වෛද්‍ය ලියවිලි, බිල්පත් ආදිය රැගෙන ගෙයින් ගෙට ගොස් ආධාර උපකාර පතා ආයාචනා කරන්නෝ එමටයි. ඒ එසේ වුවද, අපූර්වා හා ඇගේ මවගේ දුක්ගැනවිල්ල සැබෑ බව පසක්වූ පසු අපූර්වා තමී ළදැරියට උපකාර කිරීමට මෙම වෛද්‍යවරයා ඉදිරිපත් විය. අපූර්වා උපතින්ම ශ්‍රවණ ආබාධිත වූ අයෙකි. නොයෙකුත් බාධා අවහිර මැද බොහෝ දෙනෙකුගේ අධාර උපකාර මත ඇය ඉන්දියාවේ රෝහලකින් අමාරු සත්කමකින් පසු ශ්‍රවණය ලබා ඇත. නමුත් ඇයගේ කනට සවිකරන ලද ශ්‍රවන ආධාරකය වසර කිහිපයකට පසුව ක්‍රියාවිරහිත වී ඇත්තේ ඊට අදාල උපකරණය 'SPEECH PROCESSOR' අක්‍රිය වීම හේතුවෙනි. නව උපකරණයක මිල රු. 955,000/= ක් වන නිසා ඊට මුදල් සොයා ගෙන් ගෙට යමින් සිටි අපූර්වා හා ඇගේ මවට වෛද්‍ය සුනෙත් මැතිතුමා මුණ ගැසුනේ මේ අතරය.

අපූර්වාගේ දුක්ගැනවිලි කථාව සත්‍යබව වටහාගත් මේ සහෘද වෛද්‍යවරයා වහා ක්‍රියාත්මක වී විදෙස් රටවල සේවය කරන තම හිතවතුන් ඇමතීය. වැඩිකල් නොගොස් අවැසි මුදල් සොයාගෙන අපූර්වා ළදැරියට අවශ්‍ය පිළිසරණය ලබාදුන්නේ මනුෂ්‍යත්වයේ නාමයෙනි. අපූර්වාට තිබුණු රෝගී තත්වයට සමාන වූ රෝගී තත්වයකින් පෙලුනු මගේ නෑ දරුවෙකුඳ සිටීයේ අධික අසරණ තත්වයකය. නමින් අෂේර වූ 12 හැවිරිදි මෙම පුතා මෙයට වසර 7කට පමණ ඉහතදී කනෙහි ඇති වූ ආබාධයකට කොළඹ 'ඩර්ඩන්ස්' රෝහලේදී ජනාධිපති අරමුදල් ඇතුළු තවත් බොහෝ දෙහෙකුගේ ආධාරද සමග ඉතා අමාරුවෙන් සොයාගත් මුදල වූ රුපියල් ලක්ෂ 27ක පමණ වියදමකින් සත්කමකට භාජනය විය. ඊට පසු අපූර්වා දැරියගේ මෙන්ම මෙම පුතාගේද කනට බාහිරයෙන් සවිකර තිබූ ආධාරක උපකරණය 'SPEECH PROCESSOR' ක්‍රියා විරහිත විය.

මෙම අධාරක උපකරණය ලබාගැනීමට රුපියල් 955,000/= ක මුදලක් අවශ්‍ය විය. මෙවැනි විශාල මුදල් ප්‍රමාණයක් සොයා ගැනුමට දෙමාපියන් අපොහොසත් වූයේ මොවුන් ඉතා අඩු ආදායම් ලාභී පවුලක් වූ නිසාය. ඉහතකී මුදල සොයා ගැනුමට අපොහොසත්ව අසරණව අනාථ වී සිටිනාවිට සුනෙත් වෛද්‍යවරයාගේ යටකී පුවත්පතකට සැපයූ ලිපිය කියවීමට ලැබීම අෂේර පුතාගේ වාසනාවකටම විය හැකිය.

පමා නොවී සුනෙත් වෛද්‍යතුමා වහා සොයාගොස් අෂේර පුතාගේ රෝගී තත්වය ගැන සාකච්ඡා කිරීමට දෙමාපියන්ට අවස්ථාව සැලසිති. වෛද්‍යවරයා විදේශ රටවල සේවය කරනා තම හිතමිත්‍රාදීන් වෙත මෙම පුතා ගැනද දුන්වා ආධාර පැතීය. දකුණු ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් නගරයේ ලයල් මැක්වින් රෝහලේ සේවය කරන වෛද්‍ය වරයෙක්ද මේ දරුවාට උපකාර කිරීමට වහා දායකවූ බව සුනත් වෛද්‍යවරයා තමා කළ සත්කාර්‍යය පිළිබඳ මාධ්‍යයට සැපයූ ලිපියෙන් දැනගනිමි. මෙම සත්පුරුෂ වෛද්‍ය වරයාගේ අප්‍රතිහත ධෛර්‍ය තුළින් අෂේර පුතාගේ ශ්‍රවනය ආපසු ලබාගැනුමට අවස්ථාව සළසා දීම පිළිබඳව දරුවාගේ දෙමව්පියන් ඇතුළු අප සැම එතුමාට නමස්කාර පූර්වකව පින්දෙමු. මෙම යහපත් හදවතක් ඇති සුනෙත් මැතිතුමා මෙයින් නොනැවතී මෙවන් ආබාධිත දරුවන්ට උපස්ථාන සළසාදීමට අවශ්‍ය අරමුදලක් 2015 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවා ඇති බව මාධ්‍ය වෙත අනාවරණය කර ඇත. මේ ගැන වැඩිදුර කරුණු දැනගැනීමට 1THE COOHLEAR TRUST' යනුවෙන් FACE BOOK හා අන්තර්ජාලය තුළින්ද විමසීම් කලහැකි බව වෛද්‍යවරයා දන්වා සිටී. එතුමාගේ විද්‍යුත් තැපෙල suneth.rajawasanna@gmail.com

සමාජයේ ඉහළ තලවල වැජඹෙන අයට හෝ දේශපාලන වශයෙන් සම්බන්ධකම් ඇති අයට හෝ මුදලට හෝ වෙනත් සමාජ අවැසිතාවන් පසුපස යන නොයෙක් තාරතිරම්වල වෛද්‍ය වෘත්තීයේ යෙදෙන්නට ලොව නැතුවාම නොවේ. තරුණවියට පා තබන බාලයන්ගේ අගය, වටිනාකම සහ ගරුත්වය ගැන මනුෂ්‍යත්වයෙන් සළකන අගුගණ්‍ය හදවතක් ඇති සාමාන්‍ය ජනතාවට සමීප යහපත් මහත්මයෙක් වූ වෛද්‍ය සුනෙත් මැතිතුමාගේ ඉහත සඳහන් මානුෂීය සත්කාරට සාර්ථකව ඉදිරියට ගෙනයාමට එතුමාට අවැසි ශක්තිය හා ධෛර්ය ලැබේවායි අපගේ සුභද පැමයි.

විවියන් ප්‍රනාන්දු
පානදුර

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

"සාහිත්‍ය සම්භාෂණ"

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන **"සාහිත්‍ය සම්භාෂණ"**

එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්
සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/